**11-03-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, සිහිපත් කිරීමේ වන්දනා ගමනේ දිව යන්න, එවිට ඔබ පිවිතුරු සහ පුණ්‍යවන්ත ජීව වී, දිව්‍ය ලෝකයේ ආධිපත්‍යය හිමි කර ගනීවි.

**ප්‍රශ්නය:** බ්‍රහ්මණ දිවියේ ඔබ අතීන්ද්‍රිය සුවය නොවිඳින්නේ නම්, ඔබ වටහා ගත යුත්තේ කුමක්ද?

**පිළිතුර:** සූක්ෂම අන්දමකින් එක් හෝ තව පාප කර්මයක් නිසැකයෙන්ම සිදුවෙමින් පවතිනවා. පාපයන් සිදුවන්නේ ඔබ ශරීර අවධානයට පත් වූ විටයි, එමෙන්ම ඔබ එම සතුට අත්නොවිඳින්නේ මේ හේතුව නිසයි. ඒ නිසයි ඔබ තමන් ගොපළු ගොපලියන් බව සලකන නමුත්, අතීන්ද්‍රිය සුඛයේ හැඟීමක් ඔබට නොමැත්තේ. අනිවාර්යෙන්ම යම් වරදක් සිදුවෙමින් පවතිනවා, එබැවින් පියාට සත්‍යය පවසා, දිගින් දිගටම ශ්‍රීමත් ලබා ගන්න.

ඕම් ශාන්ති. අශාරීරික දෙවියන් කතා කරයි. භක්ති මාර්ගයේ මිනිසුන් ඔහුට බොහෝ නම් ලබා දී ඇති නමුත්, අශාරීරික දෙවියන්ට තවමත් කියන්නේ ශිවා කියායි. මෙතරම් ව්‍යාප්තියක් තිබෙන්නේ බොහෝ නම් තිබෙන නිසාය. පියාම පැමිණ ඔබට පවසන්නේ අහෝ දරුවනි, ඔබගේ පියා, ශිවා වන මාව ඔබ සිහිකරමින් සිටියා ඔබ, අහෝ පාරිශුද්ධකරුවාණෙනි! කියා කියූහ. සැබවින්ම ඔහුට තිබෙන්නේ එක නමක් විය යුතුයි බොහෝ නම් තිබිය නොහැක. ඔවුන් පවසන්නේ ශිවාට නමස්කාර වේවා කියා, එබැවින් එක් නාමය එයයි, ශිවා. නිර්මාපකයාද එක් කෙනෙකි. බොහෝ නම් තිබුණේ නම්, මිනිසුන් අවුලට පත් වෙයි. නිදසුනක් ලෙස, ඔබගේ නම පුෂ්පා වන නමුත් ඔබට කෙනෙක් ශීලා කියා අමතන්නේ නම්, ඔබ ප්‍රතිචාර දක්වයිද? නැහැ එම කෙනා වෙන කෙනෙක්ව අමතන බව ඔබ සිතයි. මෙයත් එයමයි. ඔහුට තිබෙන්නේ එක් නමක් පමණයි, නමුත් එය භක්ති මාර්ගය බැවින් සහ ඔවුන් බොහෝ දේවාල තනා ඇති නිසා, ඔවුන් ඔහුට බොහෝ විවිධ නම් දී තිබේ. එසේ නැත්නම් සෑම කෙනෙකුටම තිබෙන්නේ එක නමකි. ගංගා නදියට ඔබට යමුණා නදිය යැයි කිව නොහැක. සෑම දෙයක්ම ප්‍රසිද්ධ වන්නේ එක් නමකිනි. ශිව යන එම කෙනා ගේ නම, ප්‍රසිද්ධය. 'ශිවාට නමස්කාර වේවා' යන්න, සිහි කර තිබේ. ඔවුන් 'බ්‍රහ්ම දේවතාවට නමස්කාර වේවා! විෂ්ණු දේවතාවන්ට නමස්කාර වේවා!' යැයි කියයි. ඉන්පසුව උසස්ම උසස් කෙනා ඔහු බැවින්, ඔවුන් මෙසේද කියයි 'ශිව පරමාත්ම ජීවයට නමස්කාර වේවා'. අශාරීරික කෙනා උසස්ම උසස් කෙනා ලෙස හැඳින්වෙන බව, මිනිසුන්ගේ බුද්ධියේ තිබේ. ඔහුට තිබෙන්නේ එක නමක් පමණයි. බ්‍රහ්මට, බ්‍රහ්ම කියාද, විෂ්ණුට, විෂ්ණු යැයිද කියයි. ඔහුට බොහෝ නම් දීමෙන් මිනිසුන් අවුලට පත්ව සිටියි. ඔවුන්ට ප්‍රතිචාරයක්ද නොලැබෙන අතර ඔවුන් ඔහුගේ ස්වරූපයද නොදනී. පියා පැමිණෙන්නේ ඔය දරුවන් වෙතට පමණක් වන අතර, ඔහු කතා කරන්නේද ඔබට පමණයි. 'ශිවාට නමස්කාර වේවා' යැයි කියයි, එබැවින් එක් නාමය හොඳයි. තවද 'ශිව-ශංකර්' කියා කීමද වැරදියි. ලක්ෂ්මි සහ නාරායන යන නම් දෙක වෙනස් වන ආකාරයෙන්ම ශිවා සහ ශංකර් යන නම් දෙක වෙනස්ය. එහි, ඔවුන් නාරායන්ට, ලක්ෂ්මි-නාරායන කියා අමතන්නේ නැත. මෙකල මිනිසුන්ට නම් දෙකක් ඇත. දේවතාවන්ට නම් දෙකක් නැත. රාධේගේ නම, ක්‍රිෂ්ණාගේ නමින් වෙනස් වන නමුත් මෙහි මිනිසුන්ට රාධා-ක්‍රිෂ්ණා සහ ලක්ෂ්මි-නාරායන වැනි නම් ඇත. පියා මෙතැන අසුන් ගෙන පහදා දෙන්නේ, එක් නිර්මාණකරුවෙක් පමණක් සිටින බවත්, ඔහුට තිබෙන්නේ එක නමක් පමණක් බවත්ය. ඔහුව හඳුනාගත යුතුයි. ඔවුන් පවසන්නේ ජීවාත්මයක්, නළල මැද දිළිසෙන තාරකාවක් වැනිය, ඉන්පසුව ඔවුන් පවසන්නේ ජීවාත්මය, උත්තරීතර ජීවාත්මය බවයි, ඉන් කියැවෙන්නේ උත්තරීතර ජීවාත්මයද තාරකාවක් බවයි. ජීවාත්ම, කුඩා හෝ විශාල නැත. මේවා ඉතාමත්ම පහසු කරුණුය. පියා පවසන්නේ ඔබ කන්නලව් කළේ අහෝ පාරිශුද්ධකරු පැමිණෙන්න! කෙසේවෙතත්, ඔහු සෑම කෙනෙක්ව පිවිතුරු කරන්නේ කෙසේද කියා කිසිවෙකු නොදනී. ඔවුන් සලකන්නේ ගංගා නදිය පාරිශුද්ධකරු ලෙසින්ය. එක් පියා පමණයි පාරිශුද්ධකරු වන්නේ. පියා පවසන්නේ මා ඔබට පෙරද පැවසුවේ මන්මනාභව! නිරන්තරයෙන් මා පමණක් සිහි කරන්න! ඔවුන් කළේ නම් වෙනස් කිරිම පමණයි. ඔබ පියා සිහි කිරීමෙන්, උරුමය වටහාගත හැකි බව, ඔය දරුවන්ට වැටහෙනවා. එවිට 'මන්මනාභව!' කියා කීමට පවා අවශ්‍යතාවයක් නැත. කෙසේවෙතත්, ඔබ මුළුමනින්ම පියා සහ උරුමය අමතක කර ඇත. පියා, දිව්‍ය ලෝකයේ නිර්මාණකරුයි. එබැවින් පියා සිහිකිරීමෙන් අපට අනිවාර්යෙන්ම දිව්‍ය ලෝකයේ ආධිපත්‍යය හිමි වෙයි. පුතෙක් උපත ලද වහාම, උරුමකරුවෙක් පැමිණ ඇති බව, ඔහුගේ පියා පවසයි. දියණියක් ඉපදුණු විට, මෙසේ නොකියයි. ඔය ජීව සියල්ලක්ම පුතනුවන්ය. ජීවයක්, තරුවක් බව පැවසෙයි. එබැවින් එය මහපටැඟිල්ලක හැඩය ගන්නේ කෙසේද? ජීවාත්ම කෙතරම් සියුම්ද

කියතොත්, ඒවා මෙම දෑසින් දැකගත නොහැක. ඔව්, ජීවාත්මයක් සූක්ෂම දෙයක් බැවින්, දිව්‍යමය දර්ශනයක් තුළින් දැකිය හැක. දිව්‍යමය දර්ශනයක, ඔබට ජීවමාන ස්වරූපයෙන් එය දැක ගැනීමට හැකි වනු ඇත, නමුත් ඉන්පසුව ඔහු අතුරුදහන් වනු ඇත. ඔබට ඉන් කිසිවක් නොලැබෙන මුත් ඔබට සතුට පමණක් දැනෙයි. එයට, භක්තියේ තාවකාලික සතුට යැයි කියයි එය භක්තියේ ඵලයයි. නීතියට අනුව, භක්තියේ යෙදී ඇති අයට මෙම දැනුම තුළින්, ඉබේටම ඵල ලැබෙයි. ඔවුන් බ්‍රහ්ම සහ විෂ්ණුව එකට පෙන්වයි. බ්‍රහ්ම, විෂ්ණු බවට පත්වෙයි භක්තියේ ඵලය, රාජධානිය, විෂ්ණුගේ ස්වරූපයෙන් ලැබෙයි. ඔබට විෂ්ණු හෝ ක්‍රිෂ්ණාගේ බොහෝ දර්ශන ලැබී තිබෙන්නට පුළුවනි. කෙසේවෙතත්, බොහෝ විවිධ නම් වලින් භක්තිය සිදුකර තිබෙන බව වැටහෙයි. දර්ශන වලට ග්‍යාන් හෝ යෝගාව යැයි කිව නොහැක. දැඩි භක්තියේ යෙදීමෙන් ඔවුන්ට දර්ශන ලැබුණි. දැන්, ඔබට දර්ශන නොලැබුණත් එයට කම්නැත. ඔබගේ අරමුණ සහ ඉලක්කය වන්නේ, මනුෂ්‍යයන්ගෙන් දේවතාවන් බවට පරිවර්ථනය වීමයි. ඔබ දේවතා ධර්මයට අයත් අය බවට පත් වනවා. කෙසේවෙතත්, ඔබට උත්සාහ දැරීම සඳහා පියා පවසන්නේ ඔබගේ බුද්ධියේ යෝගාව, තමාගේ සිරුර ඇතුළුව, අන් සෑම කෙනෙකුගෙන්ම ඉවත් කරගෙන පියාව සිහිපත් කරන්න. ආදරවන්තයින් දෙදෙනෙක් ඔවුන්ගේ ක්‍රියාවල අඛණ්ඩව යෙදෙන නමුත් එකිනෙකා කෙරෙහි ඔවුන්ගේ හදවත් බැඳ තබා ගනී. පියා තවමත් පවසන්නේ නිරන්තරයෙන් මා පමණක් සිහි කරන්න! ඒ තිබියදී ඔබගේ බුද්ධිය, වෙනත් දිශා වල දිව යයි. ඔබට පහතට පැමිණෙන්නට එක් චක්‍රයක් ගත වී ඇති බව, ඔබට දැන් වැටහෙයි. ඔබ ස්වර්ණමය යුගයේ සිට, ඉනිමඟ දිගේ පහළට පැමිණෙයි. ටිකින් ටික, අඛණ්ඩව වෙනත් ලෝහ මිශ්‍ර වෙයි ඔබ සතෝ බවින් තමෝ බවට පරිවර්ථනය වෙයි. දැන් තමෝ බවින් ඔබව සතෝ කිරීම සඳහා, පියා ඔබට පිම්මක් පැනීමට සලස්වයි තමෝප්‍රධාන් බවින් තත්පරයකදී සතෝප්‍රධාන් බවට! ඔය මිහිරිතම දරුවන්, උත්සාහ දැරිය යුතුයි. පියා ඔබට දිගටම ඉගැන්වීම් ලබා දෙයි. සමහර හොඳ, නුවණැති දරුවන් මෙය සැබවින්ම අපහසු බව අත්විඳියි. ඇතැම් අය බාබාට සෑම දෙයක්ම පවසන අතර තවත් සමහරෙක් ඔහුට කිසි දෙයක් නොපවසයි. ඔබ බාබාට ඔබගේ ස්ථිතිය කිව යුතුයි. ඔබ පියා සිහිපත් නොකරන්නේ නම්, ඔබට උරුමයක් හිමි වන්නේ කෙසේද? සමහරුන් ශිව බාබාව නිසියාකාරව සිහිපත් නොකර, ඔවුන් කොහොමත් ශිව බාබාට අයත් බව සිතයි. බාබාව සිහි නොකිරීමෙන් ඔබ ඇද වැටෙයි. ඔබ නිරතුරුවම පියා සිහි කිරීමෙන්, මිශ්‍ර ලෝහ ඉවත්ව යයි. අවධානය යොමු කළ යුතුයි. ඔබට සිරුරක් තිබෙන තුරු ඔබ දිගටම උත්සාහ දරයි. ඔබට නැවත නැවතත් බාබාව සිහි කිරීමට අමතක වන බව, බුද්ධියද පවසයි. මෙම යෝගා බලයෙන් ඔබ ආධිපත්‍යය හිමි කරගනී. සෑම කෙනෙකුටම එකම ප්‍රමාණයට දිව යා නොහැක එය නීතිය නොවෙයි. තරඟයකදී සෑම විටෙකම සුළු වෙනසක් තිබේ අංක එක සිටින අතර ඉන්පසුව ධන ලකුණු තිබෙන අය සිටියි. මෙහිදීද මෙය, දරුවන් විසින් සිදුකරන තරඟයකි. ප්‍රධානතම දේ වන්නේ පියා සිහිකිරීමයි. පාපකාරී ජීවයන්ගෙන්, ඔබ පිවිතුරු පුණ්‍ය ජීව බවට පත් වන බව, ඔබට වැටහෙයි. පියා ඔබට උපදෙස් දී තිබේ දැන් පාපයන් සිදු කිරීමෙන්, එය සිය ගුණයකින් වැඩි වෙයි. පාපයන් සිදුකර, පියාට නොකියන බොහෝ දෙනෙක් සිටියි. එවිට එය එන්න එන්නම වැඩි වී, ඔවුන් අවසානයේදී අසමත් වෙයි. එය ගැන බාබාට පැවසීමට ඔවුන් ලැජ්ජා වෙයි. සත්‍යය නොකීමෙන් ඔබ තමන්ව මුලා කරගනී. ඔවුන් ගැන යමක් ඔහුට අසන්නට ලැබුණේ නම්, බාබා කුමක් සිතයිද කියා සමහරුන් බිය වෙයි. සමහරුන් ඔවුන් සිදුකළ කුඩා වරදක් කීමට පවා, බාබා වෙතට පැමිණෙයි. හොඳ දරුවන්ද විශාල වැරදි සිදු කරන බව, බාබා ඔවුන්ට පවසයි. මායා, හොඳ මහාරතීන්ව පවා අත්නොහරියි. මායා, ශක්තිමත් අයව කරකවා අතහරියි. ඔබ මේ පිළිබඳව නිර්භීත විය යුතුයි. බොරුවට, දිගටම පැවතිය නොහැක! සත්‍යය පැවසීමෙන් ඔබ සැහැල්ලු වෙයි. බාබා කෙතරම් විස්තර කළත්, යම් යම් දේ දිගටම සිදු වෙයි. බොහෝ විවිධ අන්දමේ අවස්ථාවන් සිදුවෙයි. දැන් ඔබ පියාගෙන් රාජධානිය හිමි කරගැනීමට සිටින නිසා, පියා පවසන්නේ ඔබගේ බුද්ධිය අන් සෑම තැනකින්ම ඉවත් කරගන්න. ඔය දරුවන්ට දැන් දැනුම ලැබී තිබේ. වසර 5000 කට පෙර, භාරතය දිව්‍ය ලෝකය විය. ඔබ දැන් ඔබගේ උපත් ගැන දන්නවා. සමහරුන් අංගවිකලව උපදියි. ඒ සියල්ලම ඔවුන්ගේ කර්මයට අනුවයි. එසේ නැත්නම්, මනුෂ්‍යයන්, මනුෂ්‍යයන්ය. පියා විස්තර කරන්නේ පළමුව, පාරිශුද්ධව රැඳී සිටින්න! දෙවනුව බොරු කීම හෝ පාපයන් සිදු කිරීම, නොකරන්න. එසේ නැත්නම් විශාල පාඩුවක් සිදු වෙයි. බලන්න, වරදක් සිදු කර, එසැනින් පියා වෙතට පැමිණ, මෙසේ පැවසූ කෙනෙක් විය බාබා, කරුණාකර මට සමාවන්න! මා කිසිදා එය නැවත සිදු කරන්නේ නැහැ! බාබා පැවසුවේ බොහෝ දෙනෙක් එවන් වැරදි සිදු කරයි. ඔබ සත්‍යය පවසන නමුත් ඇතමුන් ඒ ගැන බාබාට පවා නොකියයි. ඇතැම් දියණියන් අංක එකේ අයයි ඔවුන්ගේ බුද්ධි වෙන කොහේවත් ඇදී නොයයි. නිදසුනක් වශයෙන් බොම්බායේ වෛද්‍ය නිර්මලා අංක එකේ කෙනෙක්. ඇයට ඉතා පිරිසිදු හදවතක් තිබේ. කිසිම විටෙක ඇගේ හදවතේ වැරදි සිතිවිලි නැත. ඇය බාබාගේ හදවතේ අසුන්ගෙන සිටින්නේ මේ නිසාය. ඇය මෙන් වෙනත් දියණියන්ද

සිටිනවා. පියා පවසන්නේ පියාව අවංක හදවතකින් සිහිපත් කරන්න, එපමණයි. ක්‍රියාවන් සිදු කළ යුතුයි. ඔබගේ බුද්ධි, යෝගාවෙන් පියාට සම්බන්ධ කළ යුතුයි. ඔබගේ දැත් වැඩෙහි කාර්ය බහුල විය හැක, නමුත් ඔබගේ හදවත ආදරවන්තයා සමඟ තබා ගන්න. අවසානයේ ඇති ස්ප්‍රීතිය මෙයයි, එය සිහිකර ඇත්තේ ඔබට අතීන්ද්‍රීය සුඛය ගැන දැන ගැනීමට අවශ්‍ය නම්, එම ස්ප්‍රීතිය අත්කරගත්, ගොපළු ගොපළියන් ගෙන් විමසන්න. පාපයන් සිදු කරන අයට, මෙම ස්ප්‍රීතිය අත්කර ගත නොහැක. බාබාට සෑම දෙයක්ම ඉතා පැහැදිලිව වැටහෙයි, මේ නිසයි භක්ති මාර්ගයේදීද, හොඳ සහ නරක ක්‍රියාවන්ගේ ඵලය පියා ලබා දෙන්නේ. අන් අයට දුක් දෙන අය, අනිවාර්යයෙන් දුක අත්විඳියි. කෙනෙක් කුමන ක්‍රියා සිදුකළත්, ඔහුට ඒවාට විඳින්නට සිදු වෙයි. මෙහි පියාම ඔබ ඉදිරියේ පෙනී සිට දිගින් දිගටම ඔබට පහදා දෙයි. කෙසේවෙතත්, රජය, ඔහුයි. ධර්මරාජ් සිටින්නේ මා සමඟයි. මෙකල කිසිම දෙයක් මාගෙන් වසන් කරන්නට එපා. මෙසේ නොසිතන්න 'බාබා සෑම දෙයක්ම දන්නවා. මට හදවතින් ශිව බාබාගෙන් සමාව ඉල්ලා ගත හැක.' ඒ අන්දමින් කිසි දේකට සමාව ලැබෙන්නේ නැත. කිසිම කෙනෙකුගේ පාපයන් සැඟවිය නොහැක. පාපයන් සිදු කිරීමෙන්, ජීවාත්ම, දිනෙන් දින පාපකාරී ජීව බවට පත් වෙයි. එය ඔවුන්ගේ භාග්‍යයේ නොමැති නම්, දිගින් දිගටම සිදු වන්නේ මෙයයි ඔවුන්ගේ වාර්තාව නරක් වෙයි. වරක් කෙනෙක් බොරුවක් කියා, සත්‍යය නොපවසන්නේ නම්, එම කෙනා එය සෑම විටෙකම කරන බව වටහාගත හැක. බොරුව වසන් කළ නොහැක. කෙසේවෙතත්, පියා අඛණ්ඩව ඔය දරුවන්ට පහදා දෙයි. මෙසේ කියමනකි පිදුරු ගසක් සොරකම් කරන කෙනෙකුට ඕනෑම දෙයක් සොරකම් කළ හැක. මේ නිසයි ඔබ කළ වැරදි දේ ගැන, ඔබ බාබාට පැවසිය යුත්තේ. බාබා ඔබගෙන් විමසන විට, ඔබ පවසන්නේ, 'ඔව්, මා එම වරද සිදු කළා.' ඉතිං, ඔබම, එය බාබාට නොකීවේ ඇයි? දරුවන් බොහෝ දේ වසන් කරන බව, බාබා දන්නවා. ඔබ බාබාට ඒ ගැන පවසන විට, ඔබට ශ්‍රීමත් ලබා ගත හැක. ඔබට යමෙකුගෙන් ලිපියක් ලැබෙන ඕනෑම විටෙක, ඔබ ලබා දිය යුතු ප්‍රතිචාරය කුමක්ද කියා, බාබාගෙන් විමසන්න. ඒ ගැන බාබාට පැවසීමෙන්, ඔබට ශ්‍රීමත් ලැබෙයි. බොහෝ දෙනෙකුට නරක පුරුදු තිබේ, එබැවින් ඔවුන් ඒවා වසන් කරයි. සමහරුන්ට ඔවුන්ගේ ලෞකික නිවෙස් වලින්, යම් යම් දේවල් ලැබෙයි. බාබා පවසන්නේ ඔබට එය පැළඳිය හැකි බව බාබා පවසන්නේ නම්, එවිට බාබා එයට වග කියයි. ඔවුන්ගේ ස්ප්‍රීතිය දැකීමෙන්, ඔවුන්ට ලැබී ඇති ඕනෑම දෙයක්, යාගයට යැවීමට කියා බාබා විටෙක පවසයි. එය ඔබ වෙනුවෙන්, යාගයේ යම් දෙයකට හුවමාරු කරන්නේ නම් එය ඉතා හොඳයි. එසේ නැත්නම් ඔබට දිගින් දිගටම එය සිහි වෙයි. බාබා ඔබව බොහෝ සේ සැලකිලිමත් කරයි. මාවත, බොහෝ උස් බෑවුමකි. සෑම පියවරකදීම ශල්‍ය වෛද්‍යවරයාගෙන් අවවාද ලබා ගත යුතුයි. බාබා ඔබට අවවාද කරන්නේ, ඊතලය ඉලක්කයට වදින අන්දමින් ඔබ ලිපියේ ලිවිය යුත්තේ කුමක්ද කියා පමණයි. කෙසේවෙතත්, බොහෝ දෙනෙකුට බොහෝ සෙයින් ශරීර අවධානය තිබේ. ශ්‍රීමත් නොපිළිපැදීමෙන්, ඔවුන් තම ගිණුම් පළුදු කරගනී. ශ්‍රීමත් පිළිපැදීමෙන්, සෑම අවස්ථාවකදීම යහපත සිදුවෙයි. මාවත බොහෝ සේ පහසුයි! බාබාව සිහි කිරීමෙන් පමණක් ඔබ ලෝකයේ අධිපතියන් වෙයි! බාබා, මහළු මව්වරුන්ට පවසන්නේ පියාව සහ උරුමය පමණක් සරළව සිහි කරන්න. පුරවැසියන් නිර්මාණය නොකරන අයට, රජ කෙනෙක් හෝ රැජිනියක් විය නොහැක. කෙසේවෙතත්, යම් යම් දේ වසන් කරන අයට වඩා උසස් තත්ත්වයක් ඔවුන් හිමි කරගනී. පියාගේ වගකීම වන්නේ ඔබට විස්තර කිරීමයි, එවිට ඔවුන්ට ඒ බව පැවසුවේ නැති බව, කිසි කෙනෙකුට කීමට නොහැකි වෙයි. බාබා ඔබට සෑම දේකටම උපදෙස් ලබා දෙයි. ඔබ සිදුකරන කුමන හෝ වැරදීමක් ගැන ඔබ සැනෙකින් බාබාට පැවසිය යුතුයි. එයට කම් නැත, නමුත් එය නැවත සිදු නොකරන්න! මේ ගැන බිය වීම ගැන ප්‍රශ්නයක් නැත. සෑම දෙයක්ම ඔබට විස්තර කෙරෙන්නේ සෙනෙහසින්ය. පියාට ඒ පිළිබඳව පැවසීමේ යහපතක් තිබේ. පියා ඔබට බොහෝ සෙනෙහස ලබා දී, ඔබට සෙනෙහසින් පහදා දෙයි. එසේ නැත්නම් ඔබ හදවතින් මුළුමනින්ම වැටෙයි. ඔබ මෙම කෙනාගේ හදවතින් වැටෙන්නේ නම්, ඔබ ශිව බාබාගේ හදවතින්ද වැටෙයි. ඔබට සෘජුවම ශිව බාබාගෙන් ලබා ගැනීමට හැකි බව සිතන්න එපා. කිසි දෙයක් ඒ අන්දමින් සිදු වන්නේ නැත. පියාව සිහිපත් කිරීමට කියා, ඔබට වැඩියෙන් විස්තර කරන තරමට, බුද්ධිය වැඩියෙන් පිටතට දිව යයි. පියා මෙතැන අසුන් ගෙන මේ සෑම දෙයක්ම සෘජුවම විස්තර කරයි. පසුව ආගමික ග්‍රන්ථ නිර්මාණය වන්නේ මෙයින්ය. භාරතයේ වඩාත්ම ශ්‍රේෂ්ඨ ආගමික ග්‍රන්ථය වන්නේ ගීතාවයි. දෙවියන් විසින් පැවසූ ගීතාව සියලුම ග්‍රන්ථයන්ගේ මාණික්‍යය බව සිහිකෙරෙයි. අන් සියලුම ආගම් පැමිණෙන්නේ පසුවයි. ගීතාව, මව සහ පියාය අන් සියල්ල දරුවන්ය. ගීතාවේ පමණයි 'දෙවියන් පවසයි' කියා සඳහන් වන්නේ. ක්‍රිෂ්ණා දේවතා සමාජයේ කොටසක් බව කියැවෙයි. බ්‍රහ්ම, විෂ්ණු සහ ශංකර්ට පමණයි, දේවතාවන් යැයි කියන්නේ. පරමාත්ම දෙවියන්, දේවතාවන්ට වඩා ඉහළය. බ්‍රහ්ම, විෂ්ණු සහ ශංකර්ව නිර්මාණය කළේ, ශිවාය. මෙය සක්සුදක් සේ පැහැදිලිය. ස්ථාපනය සිදුවන්නේ බ්‍රහ්මගේ මාර්ගයෙනි. ක්‍රිෂ්ණාගේ මාර්ගයෙන් ස්ථාපනය සිදුවන බව කිසිදා

කියන්නේ නැත. ඔවුන් බ්‍රහ්මගේ ස්වරූපය පෙන්වා ඇත. කුමක ස්ථාපනයද? විෂ්ණු දේශයේ. පිංතූරය ඔබගේ හදවත්වල සනිටුහන් වී තිබිය යුතුයි. අපගේ උරුමය, අප මෙම කෙනාගේ මාර්ගයෙන්, ශිව බාබාගෙන් හිමි කරගන්නවා. පියා නොමැතිව, අපට සීයාගේ උරුමය ලබා ගැනීමට නොහැක. පරමාත්ම පියා මෙසේ පවසන බව, ඔබට හමුවන සෑම කෙනෙකුටම කියන්න නිරන්තරයෙන් මා පමණක් සිහි කරන්න! අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ගමනාන්තය බොහෝ උසස්ය, එබැවින් සෑම පියවරකදීම ශල්‍ය වෛද්‍යවරයාගෙන් අවවාද ලබා ගන්න. යහපතක් සිදුවන්නේ ශ්‍රීමත් පිළිපැදීමෙන් පමණයි. පියාගෙන් කිසි දෙයක් වසන් නොකරන්න.
2. තමාගේම සිරුරෙන් සහ ශාරීරික ජීවයන්ගෙන් ඔබගේ බුද්ධියේ යෝගාව ඉවත් කරගෙන, එය ඒකායන පියාට සම්බන්ධ කරන්න. ක්‍රියා සිදු කරන අතර පවා, ඒකායන පියාගේ සිහිපත් කිරීමේ සිටීමට උත්සාහ දරන්න.

**වරදානය:** නිරන්තරයෙන් නිරන්තර හා පරිපූර්ණ මනෝභාවයක් පවත්වා ගැනීමෙන් ඔබ උත්සාහයේ ප්‍රතිඵලයේ ප්‍රතිමූර්තියක් වේවා.

බාප්දාදා සූක්ෂම කලාපයේ සිට නිරීක්ෂණය කරන්නේ සමහර දරුවන්ගේ මනෝභාවය බොහෝ සෙයින් වෙනස් වන බවයි. සමහර විට, ඔවුන්ට විශ්මිත මනෝභාවයක් ඇත, සමහර විට ප්‍රශ්නාර්ථ මනෝභාවයක් ඇත, සමහර විට, ව්‍යාකූල මනෝභාවයක් ඇත. සමහර විට, ඔවුන් ආතතියේ දෝලනයක සහ සමහර විට අවධානය යොමු කිරීමේ දෝලනයක සිටී. කෙසේ වෙතත්, සංගම් යුගය යනු උත්සාහය නොව, ප්‍රතිලාභ අත්විඳින යුගයයි, එබැවින් පරමාත්ම පියාගේ ගුණධර්ම දරුවන්ගේ ය, පරමාත්ම පියාගේ අවධිය දරුවන්ගේ අවධියයි; මෙය සංගම් යුගයේ ප්‍රතිලාභයයි. එබැවින්, නිරන්තරයෙන් නිරන්තර හා පරිපූර්ණ මනෝභාවයක් තබා ගන්න, එවිට ඔබ පරම පියාට සමාන යැයි කියනු ලැබේ, එනම්, ප්‍රතිලාභයෙ ප්‍රතිමූර්තියක්.

**පාඨය:** ඔබේ බුද්ධියේ අත බාප්දාදාගේ අතේ තබා ගන්න, එවිට ඔබ කිසිදු පරීක්ෂණ සාගරයක නොසැලී සිටිනු ඇත.

***** ඕම ශාන්ති *****

අව්‍යක්ත් සංඥාව: ඔබේ ශ්‍රද්ධා විශ්වාසයෙ අත්තිවාරම ශක්තිමත් කර නිරන්තරයෙන් නිර්භීතව හා බාධක වලින් නිදහස්ව සිටින්න. විශ්වාසවන්ත වීමේ පළමු ලකුණ නම් සෑම තත්පරයකම සහ සෑම පියවරකදීම ශ්‍රීමත් නිවැරදිව අනුගමනය කිරීමයි. නිවැරදි පිළිමයක් වීම යනු පහරට ලක් වීමයි. එය නිවැරදිව සාදනු ලබන්නේ මිටියකින් පහර දීමෙන් පමණි. ඔබ සෑමට පහර වල අත්දැකීම් ලැබී ඇත; එය අලුත් දෙයක් නොවේ. එය ක්‍රීඩාවක් මෙන් දැනේ, ඔබ දිගටම නරඹා සිනාසෙමින් ආශිර්වාද දෙයි. වීර නළුවෙකු යනු තම භූමිකාව නිවැරදිව ඉටු කරන, බුද්ධියෙ ශ්‍රද්ධා විශ්වාසය ඇති සහ බාධක වලින් නිදහස් ජීවාත්මයකි.

**සටහන**: අද, අපේ මිහිරි දාදී ගුල්සාජී, බාප්දාදාගේ දෑස්වල ආලෝකය, බාප්දාදා ඇගේ හෘද සිංහාසනයේ වාඩි කළ ඇය සිහිපත් කරන දිනයයි. බ්‍රාහ්මණ වංශයේ සැරසිලි වන අපි සියලු සහෝදර සහෝදරියන්, අව්‍යක්ත බාප්දාදාට ඔහුගෙන් ලැබුණු පෝෂණය නැවත ලබා දීමට පිරිසිදු සිතුවිල්ලක් ඇති කර ගනිමු. ශ්‍රීමත් අනුව දාදීජි සෑම පියවරක්ම නිවැරදිව ගත් අතර, ඇගේ සිනාමුසු මුහුණින් සැමවිටම සෑමට ආශිර්වාද ලබා දුන් අතර ආශිර්වාද ලබා ගත් අතර ඇගේ කොටස නිවැරදිව ඉටු කළාය. අපි ඇගේ අඩිපාරේ යමින් දාදීජිට අපගේ ආදරණීය උපහාරය පුද කරමු. මෙය දාදී ගුල්සාජිට සැබෑ උපහාරයකි. ඕම් ශාන්ති.